# මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
# மஹாபொல உயர்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்
# MAHAPOLA HIGHER EDUCATION SCHOLARSHIP TRUST FUND

4 වන මහල, ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය, 191, ධර්මපාල මාවත, කොළඹ 07, ශ්‍රී ලංකා

4ஆம் மாடி,ஜே.ஆர்.ஜயவர்தன நிலையம்,191,தர்மபால மாவத்தை,கொழும்பு 07

4TH Floor, J.R. Jayawardene centre, 191, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka


මගේ අංකය / எனது இல / My No. MTF/1/1/I (2018 / 2019)    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2020

ගරු ස්වාමීන් වහන්ස/මහත්මයාණෙනි/මෙනවියනි,

## <u>මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය - 2018 / 2019</u>

01. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය පරිදි කුසලතා/සාමාන්‍ය ශිෂ්‍යත්වයක් පිරිනැමීමට ඔබ තෝරාගෙන ඇති බව සතුටින් දන්වමි.

02.

(i) ඔබට මෙම ශිෂ්‍යත්වය ප්‍රදානය කෙරෙනුයේ ඔබගේ උසස් අධ්‍යාපන කටයුතු ආර්ථික අසීරුතාවයකින් තොරව අඛණ්ඩව හා අනලස්ව කර ගෙන යාමට සඵල පිටුබලයක් සැපයීමේ උතුම් පරමාර්ථයෙනි. ඒ අනුව ඔබ තෝරාගෙන ඇති පාඨමාලාව සඳහා නියමිත අධ්‍යයන කාලසීමාව තුල පාඨමාලාව පැවැත්වෙන කාලයේදී කුසලතා ශිෂ්‍යත්වලාභියෙකුට මසකට රු. 5,050/- ක් බැගින්ද සාමාන්‍ය ශිෂ්‍යත්වලාභියෙකුට මසකට රු.5,000/- ක් බැගින්ද එක් අධ්‍යයන වර්ෂයකදී වාරික 10 ක උපරිමයකට යටත්ව ඔබ අයත් විශ්ව විද්‍යාලයේ නිර්දේශය පරිදි, මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල මඟින් සෘජුවම ඔබගේ බැංකු ගිණුම වෙත මුදල් බැර කරනු ලැබේ. එසේ මුදල් බැර කළ බවට කෙටි පණිවිඩයක් මඟින් ඔබව දැනුවත් කරනු ඇත. ( ඔබගේ බැංකු ගිණුම් පිළිබඳ විස්තර ලබා ගැනීමට ඇමුණුම් අංක 02 සම්පූර්ණ කලයුතු වේ.)

(ii) රැකියාවක නිරතවීම නිසා හෝ ඔබගේ කැමැත්ත මත හෝ වෙනත් ඕනෑම හේතුවක් නිසා හෝ ඕනෑම අවස්ථාවක ඔබගේ ශිෂ්‍යත්වය නතර කිරීමට ඔබට ඉල්ලා සිටිය හැකිය.

03. මෙම ශිෂ්‍යත්ව ප්‍රදානයට අදාල කොන්දේසි මාලාව මෙයට යා කර ඇත. එම කොන්දේසි සුපරීක්ෂාකාරීව කියවනු මැනවි. ඔබ ශිෂ්‍යත්වය භාර ගැනීමෙන් පසුව එම කොන්දේසිවලට යටත්වනු ඇත.

04. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ අධ්‍යක්ෂ සහ විශ්වවිද්‍යාල බලධාරීන් විසින් ඔබගේ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් මතුවට පනවනු ලබන කොන්දේසි හා රෙගුලාසිවලට ද ඔබ යටත්වනු ඇත.

05. **ඔබගේ විශ්වවිද්‍යාලය, පීඨය , ලියාපදිංචි අංකය ආදියෙහි මතු සිදුවන වෙනස්කම් අප්‍රමාදව විශ්ව විද්‍යාලය වෙත දැන්විය යුතුය. විශ්වවිද්‍යාලය හෝ පාඨමාලාව මාරුවීමකදී ඒ බව නොදැන්වීමෙන් මාරුවී පැමිණි ස්ථානයේදී ශිෂ්‍යත්ව වාරික මුදල් ලබා ගැනීමට නොහැකිවනු ඇත.** ඔබගේ ශිෂ්‍යත්ව ප්‍රදාන අංකය ඉදිරි ලිපි ගනුදෙනුවලදී සඳහන් කල යුතුය. ඔබගේ අධ්‍යාපන කටයුතු ආරම්භ කල පසුව සියලු ලිපි ගනුදෙනු ඔබගේ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරී මඟින් සිදුවිය යුතුය.

06. මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානයේ සම්ප්‍රදාය අනුව, එයට හිමිකම් ලැබීම සඳහා **ඔබ විසින් පෞද්ගලිකව ශිෂ්‍යත්වය භාරගත යුතුය. එසේ නොවුවහොත් ඔබගේ ශිෂ්‍යත්වය අවලංගු වනවා ඇත.**

07. ඔබගේ අධ්‍යාපන කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

මෙයට - විශ්වාසී වූ,

**එම්.පරාක්‍රම බණ්ඩාර,**
අධ්‍යක්ෂ,
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල


දුරකථන/ தொலைபேசி / Tel: 0112685011,    ෆැක්ස්/ பெக்ஸ் / Fax: 0112675524    Web : www.mahapola.lk    Email : mahapola@mahapola.lk



1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පනත යටතේ ස්ථාපිතයි. மஹாபொல உயர்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியமானது 1981 ஆம் ஆண்டின் 66 ஆம் இலக்க சட்டத்தினால் தாபிக்கப்பட்டதாகும் Established under Mahapola Higher Education Scholarship Trust Fund Act No.66 of 1981

# මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානයට හා වාරික ගෙවීම්වලට අදාල කොන්දේසි

මහපොළ ශිෂ්‍යත්වයට හිමිකම් ලැබීමට හා එම ශිෂ්‍යත්වය වෙනුවෙන් ගෙවන ශිෂ්‍යත්ව වාරික මුදල් පාඨමාලාවේ අධ්‍යයන කාලය තුලදී ලබාගැනීමට පහත සඳහන් අවශ්‍යතා හා කොන්දේසි සපුරාලිය යුතුවේ.

1. ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබ ඇති පාඨමාලාවේ, ශිෂ්‍යත්වලාභියා විසින් අධ්‍යයන කටයුතු වලින් ලබාගන්නා ප්‍රගතිය මත විශ්වවිද්‍යාලයේ නිර්දේශය අනුව, ශිෂ්‍යත්ව වාරික මුදල් මාසිකව ගෙවනු ලැබේ.

    1.1. විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව සඳහා අධ්‍යයන වර්ෂයකට වාරික 10 ක උපරිමයකට යටත්ව ශිෂ්‍යත්ව වාරික ගෙවනු ලැබේ.

    1.2. පාඨමාලාවට නියමිත දේශන, නිබන්ධන පන්ති හා ප්‍රායෝගික පන්ති ආදී පාඨමාලාවේ කටයුතුවලට විධිමත් පරිදි, සහභාගී විය යුතු අතර, සියලුම ශිෂ්‍යත්වලාභී සිසුන් පළමු සමාසික (Semester) අවසානයේ පවත්වන විභාග සඳහා සුදුසුකම් ලබා ඇති බව විශ්ව විද්‍යාලයේ අදාල පීඨයේ පීඨාධිපති විසින් සහතික කොට උපකුලපති විසින් අනුමත කොට මහපොළ අරමුදල වෙත එවීම මඟින් ශිෂ්‍යත්ව වාරික ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන අතර එම සහතිකය මත ඉදිරි මාස 06 සඳහා වාරික අඛණ්ඩව ගෙවීම සිදුකරනු ලැබේ. එසේ නොවන අවස්ථාවල ඒ පිළිබඳ විශ්ව විද්‍යාලයෙන් ඉදිරිපත් කරන නිර්දේශය අනුව ශිෂ්‍යත්ව ගෙවීම අත්හිටුවීම සිදුවනු ඇත. එම සිසුන්ගේ ගෙවීම නැවත සක්‍රීය කර ගැනීම සඳහා වර්ෂයේ දෙවන සමාසිකය (Semester) විභාග සඳහා සිසුන් සුදුසුකම් ලබා ඇති බව විශ්ව විද්‍යාලය විසින් මහපොළ අරමුදල වෙත දැනුම්දිය යුතුය.

    1.3. යම් සිසුවෙක් පළමු සමාසිකය(Semester) විභාග සඳහා සුදුසුකම් ලබා නොතිබුණත් පීඨාධිපතිවරයා විසින් දෙවන සමාසිකය (Semester) සඳහා සුදුසුකම් ලබා ඇති බව නිර්දේශ කිරීමෙන් පසු ඔහුගේ හෝ ඇයගේ අත්හිටුවූ වාරික නැවත සක්‍රීය කිරීමට සලකා බලනු ලැබේ.

    1.4 ශිෂ්‍යත්ව වාරික ගෙවීම සඳහා ශිෂ්‍යත්වලාභීන්ගේ නම් විශ්ව විද්‍යාලය මඟින් නිර්දේශ කරන අතර එසේ නිර්දේශ නොවුවහොත් ඒ පිළිබඳව විශ්ව විද්‍යාලයෙන් විමසිය යුතුය.

    1.5 මෙම ශිෂ්‍යත්වය භාර ගැනීමෙන් පසුව මෙම පාඨමාලාව හෝ වෙනත් පාඨමාලාවකට හෝ වෙනත් කිසිදු ශිෂ්‍යත්වයක් හෝ ශිෂ්‍යාධාර මුදලක් ලබාගැනීමට ඔබට අවසර නැත. වෙනත් ශිෂ්‍යත්වයකට හිමිකම් ලබන ශිෂ්‍යයෙකු ඔහුට / ඇයට මනාපය පරිදි පළමු ශිෂ්‍යත්වයේම පමණක් රැඳී සිටීම හෝ පළමු ශිෂ්‍යත්වය අවලංගු කර නව ශිෂ්‍යත්වය ලබා ගැනීම හෝ සිදුකළ හැකිය. **එවැනි අවස්ථාවලදී ශිෂ්‍යයා විසින් වහාම ඒ බව තම විශ්ව විද්‍යාලය වෙත දැනුම්දිය යුතුය.**

2. පහත සඳහන් අවස්ථාවල **ශිෂ්‍යත්වය අවලංගු වනු ඇත.** ඒ සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනා ද සලකා බලනු නොලැබේ.

    i. පාඨමාලාවට සහභාගී නොවීම.
    ii. දීර්ඝකාලීනව පාඨමාලාවට සහභාගී නොවීම.
    iii. වාර්ෂික විභාග අසමත්වීම.
    iv. පාඨමාලාව අත්හැරයාම.
    v. විනය විරෝධී ක්‍රියා හේතූන් මත පන්ති තහනම් කිරීම.
    vi. නවක වදය සම්බන්ධයෙන් දඬුවම් ලැබීම.
    vii. විෂමාචාර ක්‍රියා පිළිබඳ වැරදිවලදී හෝ අපචාර හා අපයෝජන සිද්ධීන්ට සම්බන්ධවීම මත විශ්ව විද්‍යාලය මඟින් විනය පරීක්ෂණ පවත්වා දඬුවම් ලබා ඇති අවස්ථාවකදී හෝ අනෙකුත් වැරදි සම්බන්ධව උසාවියක් මඟින් දඬුවම් ලබා ඇති අවස්ථාවක
    viii. විශ්ව විද්‍යාලවල දේපලවලට හෝ රාජ්‍ය දේපලවලට හානි සිදුකිරීම මත දඬුවම් ලැබීම.
    ix. ආදායම් ලැබීම පිණිස ව්‍යාපාරයක, සේවයක හෝ රැකියාවක නියුක්තවීම යන හේතුද මෙම ශිෂ්‍යත්ව වාරික මුදල් සහ හිමිකම් නොලැබීමට හේතුවනු ඇත.

3. ශිෂ්‍යයාගේ පාලනයෙන් බැහැර වූ නොවැලැක්විය හැකි හේතූන් මත ශිෂ්‍යයා විසින් තම අධ්‍යයන කටයුතු කල්ගනු ලබන අවස්ථාවේදී අදාල ඉදිරි වර්ෂයේදී මෙම ශිෂ්‍යත්වය ලබාගැනීමට බලාපොරොත්තු වන්නේ නම් හා එවැනි **කල්ගැනීම් වලදී වුවද** තම ශිෂ්‍යත්වය සඳහා හිමිකම් ලැබීමට නම් ශිෂ්‍යයා විසින් පළමුව ශිෂ්‍යත්ව ප්‍රදානයේදී සිය ශිෂ්‍යත්ව සහතිකය ලබාගත යුතුය. ඒ පිළිබඳ නිර්දේශය විශ්ව විද්‍යාල මඟින් මහපොළ අරමුදල වෙත ලබාදිය යුතුය.

4. ශිෂ්‍යයාගේ වර්තමාන විශ්වවිද්‍යාල පාඨමාලාව පසුව වෙනස් වුවහොත් එවැනි ශිෂ්‍යයෙකු ලබාගෙන ඇති ලකුණු ප්‍රමාණය අනුව නව පාඨමාලාව යටතේද ශිෂ්‍යත්වයක් ලැබීමට සුදුසුකම් ඇති බව පෙනී ගියහොත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව අලුත් ශිෂ්‍යත්වයක් ප්‍රදානය කරනු ලැබේ. එම ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලැබීමට විශ්ව විද්‍යාලය මඟින් නිර්දේශ කල යුතුය.

5. ශිෂ්‍යත්ව හෝ ශිෂ්‍යත්ව වාරික සම්බන්ධයෙන් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ තීරණය අවසන් තීරණය වනු ඇත.

අධ්‍යක්ෂ
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල